# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2278/19 - 2022 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2022.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කොළඹ මහා නගර සභාව

මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා

2021 සැප්තැම්බර් මස 06 වැනි දින පවත්වනු ලැබූ කොළඹ මහා නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 2445 යටතේ සම්මත කරනු ලැබ ඇති කොළඹ මහා නගර සභාව විසින් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින නිවේදනය කරන ලද අංක 2245/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකර ඇති කොටස්වල දෝෂ සහිත තත්වය හේතුවෙන් එය පහත ආකාරයට නිවැරදි විය යුතු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රෝසි සේනානායක,**
නගරාධිපතිනිය,
කොළඹ මහා නගර සභාව.

2022 මැයි මස 04 වැනි දින,
කොළඹ මහා නගර සභාවේ දී ය.

**යෝජනාව**

"1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙන් ලැබී ඇති බලතල යටතේ, පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් කෙටුම්පත් කර 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබූ සහ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බවට 1991 මැයි මස 21 වැනි දින අංක 663/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල I වන කොටසේ අතුරු ව්‍යවස්ථා සහ II වන කොටසේ ඇතුළත්,

**III වන කොටස - මුදල් නියෝග**

යන අතුරු ව්‍යවස්ථාව කොළඹ මහා නගර සභාව විසින් පිළිගනු ලැබිය යුතු බවත්, එසේ පිළිගත් III වන කොටසේ සඳහන් මුදල් නියෝග සම්මත අතුරු ව්‍යවස්ථාව කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක කළ යුතු බවත් කොළඹ මහා නගර සභාව යෝජනා කරයි."

EOG 05-0022

1A - PG 5835 — 08 (2022/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*